# ඥානය පිළිබඳ බෞද්ධ විග්‍රහය

කිරම විමලතිස්ස හිමි

දාර්ශනික ක්ෂේත්‍රය තුළ සාකච්ඡා කළ මාතෘකා අතර ඥානවිභාගයට (Epistemology) හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ඥානයේ ස්වභාවය හා නිවැරිදි ඥාන මාර්ග පිළිබඳව නන් අයුරින් මෙහි දී සාකච්ඡා කර තිබේ. අපරදිග දර්ශනයේ ග්‍රීක යුගයේ සිට මධ්‍යකාලීන, නූතන හා සමකාලීන යන යන දාර්ශනික යුගවල දී විවිධ දාර්ශනිකයන් විසින් ඥානය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත්කර ඇත. පෙරදිග චින්තනය තුළ ද ආගමික සංදර්භය යටතේ මිනිස් ඥානය පිළිබඳ විවිධ අර්ථ කථන ඉදිරිපත් කර තිබෙන අයුරු දැකිය හැක. ආගම් තුළ ඥානය පිළිබඳ සාකච්ඡා කරන්නේ විමුක්තිය අරමුණු කරගෙනය. සංකල්ප විග්‍රහයන්ට වඩා බෞද්ධ ඥාන විභාගය තුළින් ද මූලික වශයෙන් අපේක්ෂා කළේ පුද්ගලයා දුකින් එතෙර කිරීම යි. මෙය වඩාත් පැහැදිලි ලෙස දක්වන්නේ නම් බෞද්ධ ඥානය නිවන අරමුණු කර ගෙන දේශනා වූවකි. එසේම ඉන් මෙපිට ළඟාවිය හැකි තත්වයන් රාශියක් ද දේශනා කර ඇත. ඥානය පිළිබඳ බෞද්ධ විග්‍රහයේ ඇති විශේෂත්වයක් නම් මනස දියුණු කිරීමෙන් ඥානය ලබාගත හැකි ආකාරය පෙන්වාදීමයි. එය නිශ්චිත ආචාර ධර්ම මාර්ගයක් ඔස්සේ යා යුතු ගමනකි.

බුදුරජාණන් වහන්සේ තමන්ට පූර්වගාමී හා සමකාලීනව සිටි චින්තකයන් ඥානය ලබාගැනීමේ මාර්ග ලෙස දැක් වූ ඉගැන්වීම් ශ්‍රැතිය, තර්කය හා අනුභූතිය යන කොටස් තුනකට බෙදා දැක්වූහ.[1] උන්වහන්සේ කාලාමයන්ට ශ්‍රැතිය හෙවත් අධිකාරය හා

තර්කය නිවැරදි ඥාන මාර්ග ලෙස සැලකිය නොහැකි බව දැක්වූයේ ඒවා සත්‍ය හා අසත්‍ය යන උභය අංශයෙන්ම යුක්ත විය හැකි නිසා ය. එහි දී අධිකාරය මත පදනම් වූ ඥාන මාර්ග හයක් ද තර්කය මත පදනම් වූ ඥාන මාර්ග හතරක් ද දක්වා ඇත.[2] බුදුරදුන් තමන් මෙයින් අයත් වන්නේ කුමන කොටසකට දැයි කරන විග්‍රහය තුළින් පැහැදිලි වන්නේ අනුභූතිවාදී ස්වරූපයක් බෞද්ධ ඥාන මාර්ගය තුළ ප්‍රකට වන බව ය. බුදුරදුන් දක්වන්නේ යමක් නිවැරදිදැයි පිළිගත යුත්තේ ඒ පිළිබඳ තමන්ටම ප්‍රත්‍යක්ෂ වූ පෞද්ගලික ඥානයක් ඇත්නම් පමණි.[3] බුදුරදුන් ප්‍රකට කළ ඥාන මාර්ගය හුදු විශ්වාස මාත්‍රයෙන් දැක්වූවක් නොව පෞද්ගලිකවම ප්‍රත්‍යක්ෂ කළ ඥානයකි.

බුදුරදුන් තවදුරටත් දක්වා ඇත්තේ සාම්ප්‍රදායික වශයෙන් අතින් අත පැවත ආ මතවාදයන්හි හමුනොවන යම් ධර්මයක් තමන් පෞද්ගලිකව ප්‍රත්‍යක්ෂ වශයෙන් දැක ඒ පිළිබඳ ව විශිෂ්ට ඥානයක් තමා අත්පත් කරගෙන ඇති බව ය. එසේම බෞද්ධ ඥානමාර්ගයේ විශේෂත්වය වන්නේ ඕනෑම පුද්ගලයෙකුට හුදු විශ්වාසයෙන් පිළිනොගෙන තමන්ටම අත්දැකිය හැකි වීම ය. තමාම සත්‍යෙක්ෂණය කිරීමෙන් ප්‍රත්‍යක්ෂ වශයෙන් සත්‍ය බව දත් දේ තමන් දේශනා කරන බවත් එය තමන්ම පසක් කර බැලීමට අංවක, ඍජු, බුද්ධිමත්, පුද්ගලයාට උපදෙස් දීම තමන්ගේ කාර්යය බවත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළහ.

> ''ඍජු ගුණයෙන් යුත් අවංක බුද්ධිමත් පුද්ගලයාට තමන් සමීපයට ඒමට ඉඩ දෙන්න. මම ඔහුට ධර්මය උගන්වා උපදෙස් දෙන්නෙමි. මගේ ඒ උපදෙස් අනුව ක්‍රියා කිරීමෙන් වැඩි කල් නොදී ඔහුටම ඒ පිළිබඳව දැනුම් ඇති කරගැනීමට ද ඔහුටම එය දැකීමට ද හැකි වන්නේය.''[8]

යනුවෙන් ස්වකීය ධර්මය වැඩි කල් යා නොදී මේ ජීවිතයේදීම එහි ප්‍රතිඵල දැකිය හැකි දෙයක් ලෙස දක්වා ඇත. එසේම කැමති කෙනෙකුට පැමිණ බලන ලෙස ද ආරාධනාවක්



ද කර ඇත. මෙයින් පැහැදිලි වන්නේ මෙම බෞද්ධ ඥාන මාර්ගය පෞද්ගලික වූ එක් පුද්ගලයෙකුටම සීමා වූ දෙයක් නොවන බව මෙන්ම පොදුවේ කාටත් ප්‍රත්‍යක්ෂ කළ හැකි දෙයක් බව ය. උන්වහන්සේ විසින් හඳුන්වා දුන් සත්‍ය සෙසු ඉගැන්වීම් තුළින් වෙසෙසා දැක්වීම සඳහා ආර්ය සත්‍ය වශයෙන් ද දක්වා ඇත.

පොදුවේ ඥානය යන්න තුළින් එක් අර්ථයක් ගම්‍ය වුවද ඥානයේ විවිධ අවස්ථා ප්‍රකට කරනු සඳහා √ඤා ධාතුව මුල්කරගෙන සැකසුනු පද ගණනාවක් ත්‍රිපිටකය තුළ භාවිත කර ඇත. පාලි අටුවා තුළ ද මෙම √ඤා ධාතුව මූලික කොට ගත් පද නිරන්තරයෙන් හමු වේ.

| | | | |
|---|---|---|---|
| සම් | +√ඤා | = සඤ්ඤා | = සංජානාති |
| වි | +√ඤා | = විඤ්ඤා | = විජානාති |
| අභි | +√ඤා | = අභිඤ්ඤා | = අභිජානාති |
| පරි | +√ඤා | = පරිඤ්ඤා | = පරිජානාති |
| ප | +√ඤා | = පඤ්ඤා | = පජානාති |

සරල වශයෙන් පැහැදිලි කිරීමේ දී දැනුම වශයෙන් අප ව්‍යවහාර කරන අර්ථය √ඤා යන ධාතුව තුළින් නිරූපණය වේ. ඥානයේ ස්වරූපය අවශ්‍යතාවන් අනුව විවිධ වේ. ත්‍රිපිටකය තුළ පැහැදිලි කරන **සඤ්ඤා**, **විඤ්ඤා** වැනි ඥාන ප්‍රභේදයන් තුළින් විමුක්තිය සඳහා ලබාදෙන දායකත්වය අල්ප වන අතර අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වී සාංසාරික දුක ප්‍රභවය කිරීමට සමත් වේ. එබැවින් **සඤ්ඤා** හා **විඤ්ඤා** වැනි ඥානයන් තුළින් චතුරාර්‍ය්‍ය සත්‍ය පිළිබඳ නිවැරිදි වැටහීම ලබාගත නොහැක. එවැනි ඥානයන් දැක්වීමේ දී **අභිඤ්ඤා**, **පරිඤ්ඤා** වැනි පද උපයෝගී කරගෙන තිබේ. එසේම බුදුදහමේ දැක්වෙන ඥානය අධිකාරි හෝ තර්කය වැනි ඥාන මාර්ග තුළින් සපුරා වෙනස් වේ.

බෞද්ධ ඥානවිභාගය පැහැදිලි කිරීමේ දී ඥානයේ විවිධ අවස්ථාවන් නිරූපණය කිරීම සඳහා භාවිත කොට තිබෙන මෙකී පද අධ්‍යයනය කිරීම අවශ්‍ය කාරණාවකි. ඒ අනුව ත්‍රිපිටකය තුළ සුලභව දැකගත හැකි පද යුගලක් වන්නේ **සඤ්ඤා** හා **විඤ්ඤාණ** යන්නයි. බුදුදහම පුද්ගලයාගේ ඉන්ද්‍රිය සංජානන ක්‍රියාවලිය පැහැදිලි කිරීම සඳහා මෙම පද බහුල වශයෙන් යොදාගෙන තිබෙන අයුරු පෙනේ. එහි ප්‍රකට අවස්ථාවක් වශයෙන් ම.නි. මධුපිණ්ඩික සූත්‍රය දැක්විය හැකිය. එහි ඉන්ද්‍රිය ඥාන ක්‍රියාවලිය ආරම්භ වන අවස්ථාවේ දී පුද්ගලයා විසින් අරමුණ පිළිබඳව මූලික වශයෙන් සිදුකරන හඳුනාගැනීම **විඤ්ඤාණය** වශයෙන් දක්වා තිබේ.

> ''චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං''

මේ අනුව අභ්‍යන්තර ආයතන සහ බාහිර ආයතන එකිනෙකට හමුවීමේ දී මූලික වශයෙන් ඇතිවන්නේ විඥානමය තත්ත්වයකි. එනම් කිසියම් වූ අරමුණක් පුද්ගලයාගේ ඉන්ද්‍රියන්ට හසු වූ බව දැනගන්නා නුවණකි. මෙය දී හුදෙක් අරමුණ පිළිබඳව පරිපූර්ණ දැනුමක් නොව එහි මූලික අවස්ථාවයි.

> ''චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංඝති ඵස්සො ඵස්ස පච්චයා වෙදනා යං වෙදෙති තං සංජානාති''[5]

මේ තුළින් පැහැදිලි වන්නේ විඥානමය තත්ත්වයන්ට වඩා කිසියම් ගැඹුරු ඥානමය අවස්ථාවක් සංඥා යන්නෙන් දක්වා ඇති බවයි. නමුත් මෙම ඥානය ඉන්ද්‍රිය ක්‍රියා සම්බන්ධව හටගන්නා ඥානයක් මිස බුදුදහමේ දැක්වෙන විමුක්ති ඥානය මේ තුළින් අර්ථවත් නොවේ. සංඥා යන පදය විග්‍රහ කර බැලීමේ දී ඒ පිළිබඳ ඉතා පුළුල් ඉගැන්වීම් රාශියක් ත්‍රිපිටකයේ ඇතුළත් වේ. ප්‍රධාන වශයෙන් එසේ හමුවන අවස්ථා කිහිපයක් මෙසේ දැක්විය හැකිය. පංචස්කන්ධ විග්‍රහය තුළ හමුවන සඤ්ඤා ස්කන්ධය, එසේම කාම සඤ්ඤා, පටිඝ සඤ්ඤා යන විග්‍රහය, අෂ්ඨ සමාපත්ති සඳහන් කිරීමේ දී නේවසඤ්ඤා හා නාසඤ්ඤා



යන විග්‍රහය, නානත්ත සඤ්ඤා යන විග්‍රහය, ගිරිමානන්ද සූත්‍රයේ හමුවන දස සඤ්ඤා වැනි අවස්ථා වෙසෙසා දැක්විය හැකිය. විශේෂයෙන් ගිරිමානන්ද සූත්‍රයේ දී සඤ්ඤා යන්න ගැඹුරින් සාකච්ඡා කර තිබේ. එහි දී ගිරිමානන්ද තෙරුන්ට දස සඤ්ඤාවන් ඇසීමට සැලැස්වීමෙන් කායික රෝග සුව වූ බව සඳහන් වේ.

> ''අනිච්ච සඤ්ඤා, අනත්ත සඤ්ඤා, අසුභ සඤ්ඤා, ආදීනව සඤ්ඤා, පහාන සඤ්ඤා, විරාග සඤ්ඤා, නිරෝධ සඤ්ඤා, සබ්බ සංඛාරෙසු අනිච්ච සඤ්ඤා''[6]

මෙහි දී අනිච්ච සඤ්ඤා යනුවෙන් දක්වා තිබෙන්නේ පංචුපාදානස්ඛන්ධයේ අනිත්‍ය ලක්ෂණ නැවත නැවත දැකීමයි. අනත්ථ සඤ්ඤා යනු ආධ්‍යාත්මික හා බාහිර ලක්ෂණයන්ගේ අනාත්ම ලක්ෂණ බලමින් වාසය කිරීමයි. ශරීරයේ අශුභ ලක්ෂණ මෙනෙහි කිරීම අසුභ සඤ්ඤා වෙයි. ආදීනව සඤ්ඤා යනු කාම සඤ්ඤාවන්ගේ ආදීනවයන් මෙනෙහි කරමින් වාසය කිරීමයි. පහාන සඤ්ඤා යනු කාම, ව්‍යාපාද, විහිංසා වැනි අකුසල ධර්ම අත්හැරීමයි. විරාග සඤ්ඤා වශයෙන් හඳුන්වා තිබෙන්නේ නිවන පිණිස යොමුවුණු විරාගය ශාන්ත, ප්‍රණීත වශයෙන් ඇතිවන සංඥාවයි. තෘෂ්ණාව ක්ෂය වීම නිරෝධ සඤ්ඤාවයි. 'සබ්බලොකෙ අනභිරත සඤ්ඤා' යනු සිව් වැදෑරුම් උපාදානයන්ගේ නොඇලීමයි. 'සබ්බ සංඛාරෙසු අනිච්ච සඤ්ඤා' යනු කාම රූප හා සම්බන්ධ සියලු සංස්කාරයන් අනිත්‍ය වශයෙන් සැලකීමයි. මෙකී සියලු විග්‍රහයන් දෙස බලන විට අපට පැහැදිලි වන්නේ සංඥා යනු කිසියම් මානසික ස්වරූපයකි. නොඑසේනම් ලෝකය පිළිබඳව කිසියම් ආකාරයක හඳුනාගැනීමක් මේ තුළින් සිදු කරයි. මීට අමතරව සංඥා යන්න විවිධ අයුරින් විග්‍රහ කර තිබේ.

''සඤ්ජානාති සඤ්ජානාතීති වුච්චති. නීලකම්පි සඤ්ජානාති, පීතකම්පි සඤ්ජානාති, ලෝහිතකමපි සඤ්ජානාති'' යනුවෙන් දක්වා ඇති පරිදි නිල් රතු ආදී වශයෙන් හඳුනා ගනු ලබන්නේ

සංඥාව තුළිනි. එසේම රූප සඤ්ඤා, සද්ද සඤ්ඤා, ගන්ධ සඤ්ඤා, රස සඤ්ඤා, පොට්ඨබ්බ සඤ්ඤා, ධම්ම සඤ්ඤා යනුවෙන් ඉන්ද්‍රියන්ට ගෝචර වන අරමුණු ඔස්සේ ද සංඥා පැහැදිලි කර ඇත. භෞතික ලෝකයේ පවත්නා වස්තූන් හඳුනාගෙන ඒවායේ ලක්ෂණ තහවුරු කර ගනු ලබන්නේ රූප සංඥාවෙනි. කටින් අසන ශබ්දයන් තුළ පවත්නා විශේෂත්වයන් හඳුනාගනු ලබන්නේ ශබ්ද සංඥාව තුළිනි. ඇතැම් අවස්ථාවල ශබ්දය මගින් කිසියම් වස්තුවක් නිශ්චිත වශයෙන් හඳුනාගත හැකිය. එනම් කිසියම් පුද්ගලයෙකුගේ හඬ ආදී වශයෙන් හඳුනාගැනීම ශබ්ද සංඥා තුළින් සිදු කරයි. ගන්ධ සංඥාව තුළින් විවිධ සංඥා හඳුනාගනී. පැණිරස, ඇඹුල් රස, තිත්ත රස ආදී වශයෙන් විවිධ සංඥා හඳුනා ගන්නේ රස සංඥාව තුළිනි. ස්පර්ශ සංඥාව මගින් උණුසුම, සීතල වශයෙන් ශරීරයට දැනෙන ස්පර්ශ හඳුනා ගනී. සිතෙහි පහළ වන්නා වූ දුක, ශෝකය, ප්‍රීතිය ආදී සිතුවිලි හඳුනා ගනු ලබන්නේ ධර්ම සංඥාව තුළිනි. මීට අමතරව කුසල සංඥාව හා අකුසල සංඥාව වශයෙන් ද සංඥාව කොටස් කළ හැකිය. කාම, ව්‍යාපාද, විහිංසා පුද්ගලයා පාපයට නැඹුරු කරන සංඥාවන්ය. ඇතැම් සංඥාවන් දියුණු කිරීම මගින් ප්‍රායෝගික ප්‍රතිඵල ලැබේ.

උදා:- අනිත්‍ය සංඥාව වැඩීම යහපත් වන අතර නිත්‍ය සංඥාව වැඩීම අයහපත්ය.

තවද සංඥාව තුළින් අල්වා ගැනීම විවිධ ගැටලුවලට හේතුවන බව සුත්ත නිපාතයෙන් පැහැදිලි වේ.

''සඤ්ඤං ච දිට්ඨිං ච යෙ අග්ගහෙසුං
තෙ ඝට්ටයන්තා විචරන්ති ලොකෙ''[7]

එසේම සංඥාවේ නොඇලීම මානසික සහනයකට හේතු වන බව දැක්වේ. එසේම සංඥාවෙහි නොඇලුණු පුද්ගලයාට ගැට බන්ධන නැත.

''සංඥා විරත්තස්ස න සන්ති ගන්ථා..''[8]



තවද සංඥා ක්‍රියාවලිය බැඳීම්වලට හේතු වේ. උගුලකට සමාන වේ. විවිධ දෘෂ්ටිවලට එළඹීම සඳහා හේතු වන්නේ දැඩිව අල්වා ගත් සංඥාවයි. අට්ඨක වග්ගයේ සඳහන් වන ආකාරයට

''නහෙව සච්චානි බහූනි නානා
අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙ''[9]

එනම් සත්‍යයි වශයෙන් දැඩිව ග්‍රහණයකරගත් දේ යථාර්ථය නොවේ. තම තමන් වටහා ගත් දෙයයි. එය එකිනෙකාට හැඟුණදෙයෙහි එල්බ ගැනීමයි. එසේම සංසාරය නැමති සැඩ පහර තරණය කළ හැක්කේ සංඥාව පරිජානනය කිරීමෙනි.

''සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය ඔඝං''[10]

එසේම බුදුදහමෙහි පැහැදිලි කරන්නේ කාම සංඥා නොවැඩිය යුතු බවයි. එය නිරෝධයට පත් කළ යුත්තකි. සංඥාව නිරෝධය කිරීම සඳහා අධිශීල, අධිචිත්ත, අධිපඤ්ඤා සම්පූර්ණ කළ යුතුය. තව ද අනිත්‍ය සංඥාව වැඩීම තුළින් අස්මිමානය නැති වේ.

''අනිච්ච සඤ්ඤා භාවෙතබ්බා අස්මිමාන සමුග්ඝාතාය''[11]

සංයුත්ත නිකායේ දී පඤ්චස්කන්ධය උපමාවකින් පැහැදිලි කිරීමේ දී සංඥාව උපමා කර ඇත්තේ මිරිඟුවකටය.

''මරීචිකූපමා සඤ්ඤා''[12]

එනම් කාන්තාරයේ මිරිඟුව තුළින් ජලය සොයා යන සතුන් අපහසුතාවයට පත් කරන්නාක් මෙන් භෞතික ලෝකයේ දී කාම සංඥා තුළින් සත්ත්වයින් මුලාවට පත්කරයි. මෙයින් පැහැදිලි වන්නේ සංඥාව මායාවක් වන බවය.

බුදුන්වහන්සේ පොට්ඨපාද සූත්‍රයේ දී සංඥාව ආශ්‍රය කරගෙන භව නිරෝධය ඇති කරගන්නේ කෙසේ ද යන්න පැහැදිලි කර ඇත. සංඥා නිරෝධය ඇතිකරගත යුත්තේ ශික්ෂණය තුළිනි. එහි සඳහන් වන ආකාරයට සංඥාව නිවැරදිව හඳුනාගන්නේ අධිශීල, අධිචිත්ත, අධිපඤ්ඤා යන ශික්ෂා තුළිනි.

එහි දී බුදුරදුන් පැහැදිලි කරන්නේ සැදැහෙන් සසුන් ගත වන කුලපුත්‍රයා කුසල සහගත කාය වාග්සංවරයෙන් යුක්තව ඉන්ද්‍රියන්ගේ වැසූ දොරටු ඇතිව ආහාරයේ පමණ දැන යෝනිසෝ මනසිකාරයෙන් පසුවන බවයි. එම පුද්ගලයා සංඥාව තණ්හා, දිට්ඨි, මාන වශයෙන් ග්‍රහණය කර නොගෙන ත්‍රිලක්ෂණානුරූපව ඒවා විනිශ්චය කරයි. පංච නීවරණ ධර්ම ප්‍රහීණ කරන එම පුද්ගලයා තුළ ධ්‍යාන සිත් ඇති වේ. ක්‍රමයෙන් කාම සංඥා යටපත් කොට පළමු දෙවන සිව්වන ධ්‍යානයන් උපදවා ගනී. තවදුරටත් සිත දියුණු කරන එම පුද්ගලයා රූප සංඥා දුරු කිරීමෙන් අරූපාවචර ධ්‍යානයන් උපදවා ගනී. මේ ආකාරට සංඥාව සියුම් වන ආකාරයට අනුව ධ්‍යාන සිත් උපදවා ගැනීම බුදුදහමේ පැහැදිලි කොට ඇත. බෞද්ධ විග්‍රහයට අනුව සංඥාව සියුම් කළ පමණින් විමුක්තිය ලබාගත නොහැකිය. විමුක්තිය ලබා ගැනීම සඳහා සංඥාව හා සම්බන්ධ උපාදාන ඉතිරි නොකර නිරුද්ධ කළ යුතුය. පොට්ඨපාද සූත්‍රයේ දී පොට්ඨපාද බමුණා බුදුදහමේ පවතින්නේ එකම සංඥාවක් ද නැතහොත් බොහෝ සංඥාවන් දැයි ප්‍රශ්න නගයි. මෙයට බුදුන්වහන්සේ එක් සංඥාවක් ගැන නොව බොහෝ සංඥා ඇති බව දේශනා කළහ. ඉන් අනතුරුව පොට්ඨපාද බුදුරදුන්ගෙන් විමසන්නේ අරහත් ඵල සංඥාව පළමුවත් ප්‍රත්‍යවේක්ෂා ඥානය පසුවත් උපදී ද, නොඑසේනම් ප්‍රත්‍යවේක්ෂා ඥානය පළමුවත් අරහත්ඵල සංඥාව පසුවත් උපදීද නැතහොත් මේ දෙකම එකවිට උපදී ද යන්නයි. මෙහි දී බුදුන්වහන්සේ පළමුව අරහත්ඵල සංඥාව ඉපදී දෙවනුව ප්‍රත්‍යවේක්ෂා ඥානය උපදින බව ප්‍රකාශ කළහ.[13] මෙයින් පැහැදිලි වන්නේ ප්‍රඥාව පහළ වන්නේ සංඥාව හේතු කොට ගෙන බවයි. එබැවින් සංඥාව හා ඥානය අතර සම්බන්ධතාවක් පවතී. සංඥාව ලෞකික වශයෙන් පුද්ගලයා දුකට පත් කළ ද විමුක්තිය ලැබීමේ දී එහි උපයෝගීතාවක් පවතින බවද පෙනේ. එහෙත් විමුක්තියේ දී සියලු වේදයිත සංඥා නිරෝධයට පත්වේ.



## අභිඤ්ඤා පිළිබඳ බෞද්ධ විග්‍රහය

බුදුදහම පුද්ගලයාගේ විමුක්තිය පිළිබඳ සඳහන් කිරීමේ දී ඉන්ද්‍රිය අනුභූතියට පමණක් සීමා වන්නේ නැත. ඉන්ද්‍රියානුසාරීව ඥානය ලබා ගන්නා නමුදු බෞද්ධ විමුක්ති මාර්ගයේදී ඉන්ද්‍රිය ඥානය ඉක්මවා ලබන අතීන්ද්‍රිය ඥානයක අවශ්‍යතාව අවධාරණය කර ඇත. අභිඤ්ඤා බුදුරදුන් පහළ වන යුගය වන විටත් භාරතීය උපනිශද් සම්ප්‍රදාය තුළ සැලකිය යුතු මට්ටමේ දියුණුවක පැවැති ඥාන මාර්ගයකි. ඥාන මාර්ග සහ කර්ම මාර්ග යනුවෙන් උපනිෂද් සම්ප්‍රදාය තුළ පසුකාලීනව දියුණු වූ ක්‍රමවේද දෙකක් දැක ගත හැකිය. යෝග භාවනා පදනම් කරගත් උපනිශද් මුනිවරු ගැඹුරු මානසික අත්දැකීම් ලබාගෙන තිබූ බව ඇතැම් සූත්‍ර දේශනා තුළින් ද පැහැදිලි වේ.

බුදුදහම ඥානය ලබාගැනීම සඳහා ඉන්ද්‍රියයන් අත්‍යවශ්‍ය සාධකයක් වශයෙන් සැලකුව ද පුද්ගලයාගේ භෞතික ඉන්ද්‍රියයන් තුළින් ලෝකයේ යථා ස්වභාවය පිළිබඳ පරිපූර්ණ ඥානයන් ලබා ගත නොහැකි බව දක්වා තිබේ. එබැවින් අතීන්ද්‍රිය ඥානයන් පිළිබඳ පැහැදිලිකොට ඇත. එහිදී මෙම ඥානය අභිඤ්ඤා යනුවෙන් හඳුන්වා ඇත. එනම් සාමාන්‍ය ඥානය ඉක්මවා ලබන උසස් වූ ඥානයකි. මෙහි දී අභිඤ්ඤා යනු කිසියම් ගුඪ ඥනයක් නොවේ. ස්වභාවික හේතුඵල සිද්ධාන්තයට අනුව ලබන්නා වූ ඥාන විශේෂයකි. එසේම මෙය ඉන්ද්‍රිය උපයෝගී කොට ගොඩ නැගෙන ඉන්ද්‍රිය ඥානයේම කිසියම් වූ සංවර්ධිත අවස්ථාවක් ලෙස ද හැඳින්විය හැකිය. මෙම අභිඤ්ඤා ලබා ගැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රමවේදය නම් භාවනාමය ප්‍රඥාවයි. පුද්ගලයාගේ භාවනාමය ප්‍රඥාව දියුණු වන තරමටම ඔහුගේ සිත නීවරණ ධර්මවලින් මිදේ. එසේ මිදෙන ඔහුගේ සිත තුළ රූපාවචර හා අරූපාවචාර අත්දැකීම් ක්ෂේත්‍රවලට අයත් මානසික ස්වභාවයන් ඉස්මතු වීමට පටන් ගනී. එය හඳුන්වා ඇත්තේ ධ්‍යාන නමිනි. ක්‍රමයෙන් පුද්ගලයාගේ ධ්‍යාන සිත දියුණු වන විට ඔහුගේ භෞතික ශරීරයේ යථා ස්වභාවයන් එහි අතිරේක භාවයන් තේරුම් ගනී. එවිට ඔහු

භෞතික ශරීරයෙන් මනෝමය ශරීරයට වෙන් කරලීමට සමත් වේ. මෙය උදාහරණයක් ලෙස දැක්වීමේ දී තණ ගසකින් තණබඩය ඇත් කිරීමත්, කොපුවකින් කඩුව ඇත් කිරීමත් නයා සැව අත්හැරීමත් ආදී වශයෙන් දක්වා තිබේ. මෙම මනෝමය ශරීරය රූපී බවත් සියලු අඟ පසඟින් සමන්විත සියලු ඉන්ද්‍රියන්ගෙන් හීන නොවූවක් බවත්, සාමඤ්ඤඵල සූත්‍රයේ දක්වා ඇත.

> "සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති, රූපිං මනොමයං සබ්බංගපච්චංගිං අහීනින්ද්‍රියං"[14]

මෙසේ භෞතික ශරීරයෙන් මනෝමය ශරීරය වෙන් කරලීමේ හැකියාව ඇති ප්‍රමාණයට චිත්ත සමාධිය දියුණු කරන පුද්ගලයා තුළ සුවිශේෂී ඥාන ශක්තීන් ඇතිවීමට පටන් ගනී. ඒවා නම්

- ඉද්ධි විධ ඥානය
- දිබ්බ සෝත ඥානය
- දිබ්බ චක්ඛු ඥානය
- පරචිත්ත විජානන ඥානය
- පුබ්බෙනිවාසානුස්සති ඥානය
- ආසවක්ඛය ඥානය

මෙම අභිඤ්ඤාවන්ගේ පදනම සලකා බැලීමේ දී අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය වශයෙන් හැඳින්වූව ද දිබ්බචක්ඛු, දිබ්බසෝත යන අභිඥා ඇස හා කණ යන ඉන්ද්‍රයන්ට අනුරූපීව සැකසී ඇත. ඉද්ධිවිධ, පරචිත්ත විජානන හා පුබ්බෙනිවාසානුස්සති යන අභිඥා මනින්ද්‍රයට ගෝචර වේ. ආසවක්ඛය තුළින් සංසාරය හා සම්බන්ධ සියලු මානසික බන්ධනයන්ගෙන් මිදීම සිදුවේ. එනම් කාමාශාව, භවාශාව හා අවිජ්ජාසව යන ත්‍රිවිධ ආශ්‍රවයන්ගෙන් මිදීමේ ඥානය ආසවක්ඛය ඥානයයි. මෙම ඥානය මනින්ද්‍රියට ගෝචර වන බව කිව හැකිය. මෙයින් පැහැදිලි වන්නේ අභිඥා තුළින් ප්‍රකට වන්නේ ඉන්ද්‍රියන්ම පදනම් කරගත් එහෙත් ඥානයේ ඉතා සියුම් අවස්ථාවකි.



## ඉද්ධිවිධ ඥානය

පළමු ඥානය ඉද්ධිවිධ ඥානය වශයෙන් හඳුන්වයි. එනම් මනෝමය කය මුල් කරගෙන කරන විශේෂ ක්‍රියාවලියකි. සාමඤ්ඤඵල සූත්‍රයේ විස්තර කරන ආකාරයට එක් අයෙකු වී බොහෝ දෙනෙකු වීම, බොහෝ අයකු වී එක් අයෙකු වීම, නොපෙනී සිටීමේ හැකියාව, භෞතික වස්තුවල නොගැටී අවකාශයේ ගමන් කිරීමේ හැකියාව, පෘථිවියෙහි දියෙහි මෙන් කිමිදීමේ හැකියාව, ජලයෙහි ඇවිදීමේ හැකියාව, පක්ෂියෙකු මෙන් ආකාශයේ ගමන් කිරීමේ හැකියාව මෙම ඥානය තුළින් ලැබේ.[15]

## දිබ්බසෝත ඥානය

මෙම ඥානය තුළින් ප්‍රකට කරන්නේ සාමාන්‍ය මිනිසෙකුට ශ්‍රවණය වන සීමාව ඉක්මවා පවතින්නා වූ ශබ්ද ශ්‍රවණය කිරීමට ඇති හැකියාව යි.

> "සො දිබ්බාය සොත ධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ ච සන්තිකෙ ච"

සාමාන්‍යයෙන් මිනිස් කනට ශ්‍රවණය කළ හැක්කේ මේ මොහොතේ ඇතිවන ශබ්ද පමණි. අතීත අනාගත ශබ්ද ශ්‍රවණය කළ නොහැකිය. දිබ්බසෝත ඥානය තුළින් ළඟ හෝ දුර භේදයකින් තොරව දිව්‍ය මෙන්ම මානුෂික ශබ්ද ශ්‍රවණය කළ හැකිය.

## දිබ්බචක්ඛු ඥානය

මෙහි දී මනුෂ්‍යයාගේ දෘෂ්ටි සීමාව ඉක්මවා පහත් වූ උසස් වූ මනා පැහැ ඇත්තාවූ ද නොමනා පැහැ ඇත්තාවූ ද මිය ගොස් කර්මානුරූපීව සුගතියකට හෝ දුගතියකට පත්වන සත්ත්වයන්ගේ චුති උත්පත්තිය දැකීම දිබ්බචක්ඛු ඥානය ලෙස සැලකේ. මෙයින් ද පැහැදිලි කරන්නේ අතීත හෝ අනාගතය

සම්බන්ධව ඥානයක් නොව වර්තමානයේ පවත්නා තත්ත්වය දැකීමට ඇති හැකියාවයි.

''සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසිකෙන සත්තෙ පස්සති චවමානෙ උප්පජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.''[16]

බුදුදහමේ මෙම ඥානය ත්‍රිවිද්‍යාවන්ගෙන් එකක් ලෙස සැලකේ. සාමාන්‍යයෙන් පංච ඉන්ද්‍රයන්ගෙන් නාසය, දිව, ශරීරය යන ඉන්ද්‍රියන් පදනම් කරගෙන අභිඥා ස්වරූපයන් ප්‍රකාශයට පත්ව නැත. එයට හේතුව දුර සිට සංජානනය කළ හැක්කේ රූපයත්, ශබ්දයත් පමණි. ආලෝකය පදනම් කරගෙන රූපයත් ශබ්ද තරංග පදනම් කරගෙන ශබ්දයත් ශ්‍රවණය කළ හැක. එහෙත් දිබ්බසෝත හා දිබ්බ චක්ඛු දෙක තුළින් සාමාන්‍ය ඉන්ද්‍රිය සීමාව ඉක්මවා ගිය රූප හා ශබ්ද අද්දකින්නේ කෙසේ ද යන්න පිළිබඳ පැහැදිලි විස්තරයක් පෙළ දහමෙහි සඳහන්ව නොමැත. එහෙත් අපට අනුමාන කළ හැකි වන්නේ පළමුව සඳහන් කළ පරිදි හීන නොවූ ඉන්ද්‍රියන්ගෙන් යුතු මනෝමය කයෙහි චක්ඛු හා සෝත ඉන්ද්‍රියන් තුළින් මෙම අත්දැකීම ලැබිය හැකි බවයි. මන්ද යත් මනෝමය ශරීරය ඉඳුරන්ගෙන් හීන නොවූවක් බව දක්වා තිබීම මෙහි දී සිහිපත් කරගත යුතුය.

## පරචිත්ත විජානන ඥානය

අන්‍ය සත්ත්වයන්ගේ සිත තමන්ගේ සිතින් පිළිසිඳ දැනගැනීම මෙයින් අදහස් කෙරේ. එහි දී රාග, ද්වේශ, මෝහ, යන අකුසල ස්වරූපයන් හා වීතරාග, වීතදෝෂ, වීත මෝහ යන කුසල පක්ෂය නියෝජනය වන සිත් පිළිබඳ දැකීමට මෙම අභිඥාවෙන් හැකියාව ලැබේ. මෙහි දී මුල් වන්නේ මන ඉන්ද්‍රය යි. සාමඤ්ඤඵල සූත්‍රයේ එය දක්වා තිබෙන්නේ

''සො පරසත්තානං පර පුද්ගලානං චේතසා
චෙතො පරිච්ච පජානාති. සරාගං වා චිත්තං



සරාගං චිත්තන්ති පජානාති. වීතරාගං වා
චිත්තං වීතරාගං චිත්තංති පජානාති''[17]

## පුබ්බේනිවාසානුස්සති ඥානය

පුබ්බේ නිවාසානුස්සති ඥානය තුළින් අදහස් කරන්නේ සමාධි සිතින් පුද්ගලයාට ස්වකීය පෙර විසූ ආත්ම පරම්පරාව සිහි කිරීමට ඇති හැකියාවයි. කල්ප ගණනක් පෙර තමා කවර නම් ගොත් සහිත කවර සුවදුක් විඳිමින් සිටියේ ද යන්න මෙහි දී සිහි කළ හැකිය. මෙය ද මනසින් සිදු කරයි. සාමඤ්ඤඵල සූත්‍රයේ දී,

''සො අනෙක විහිතං පුබ්බෙනිවාසං අනුස්සරති,
සෙය්‍යථීදං එකම්පිජාතිං ද්වෙපි ජාතියො...''[18]

## ආසවක්ඛය ඥානය

ආසවක්ඛ ඥානය වශයෙන් දක්වන්නේ සසර හා සම්බන්ධ සියලු මනෝභාවයන් ප්‍රහාණය කිරීමයි. සාමඤ්ඤඵල සූත්‍රයේ දැක්වෙන ආකාරයට

''සො එවං සමාහිතෙ චිත්තෙ...ආසවානං ඛය
ඤාණාය චිත්තං අභිනීහරති, අභිනින්නාමෙති.
සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං
දුක්ඛ සමුදයොති යථාභූතං පජානාති. අයං දුක්ඛ
නිරොධොති යථාභූතං පජානාති... ''[19]

මෙහි දී පැහැදිලි කරන්නේ දුකත්, දුක්ඛ සමුදයත්, දුක්ඛ නිරෝධයත්, දුක්ඛ නිරෝධයට පිළිවෙතත් තත්ත්වාකාරයෙන් අවබෝධකර ගන්නා පුද්ගලයා සංසාරය හා සම්බන්ධ සියලු ආශ්‍රවයන් දැන ගනී. එසේම ආශ්‍රව සමුදයත් ආශ්‍රව නිරෝධයත් ආශ්‍රව නිරෝධය සඳහා පිළිවෙතත් අවබෝධ කර ගනී. ආසවක්ඛය ඥානය තුළින් ප්‍රධාන කරුණක් ගම්‍යමාන වේ. එනම් ආශ්‍රව ක්ෂයකිරීමෙන් පසුව තවත් ක්ෂය කිරීම සඳහා කෙලෙස් තම තුළ නැති බවයි. ආසවක්ඛය ඥානය හැරුණු විට

සෙසු අභිඤ්ඤා පහ තත් කාලීන භාරතීය සමාජය තුළ ආධ්‍යාත්ම ගවේෂණයේ යෙදුණු පුද්ගලයන් තුළ දැක ගත හැකි විය. එහෙත් ආසවක්ඛය ඥානය බුදුදහමට ආවේණික වූ ඥානයකි. ආධ්‍යාත්ම ගවේෂණයේ යෙදුණු තත් කාලීන දාර්ශනිකයන් අතරමන් වී සිටියේ මේ පිළිබඳව ඔවුන්ට අවබෝධයක් නොතිබූ බැවිනි. බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන් වන පරිදි ශාස්වත හා උච්ඡේද වැනි දෘෂ්ඨීවලට පැමිණීමට බෙහෙවින් බලපෑවේ පුබ්බේ නිවාසානුස්සති, චුතූපපාත වැනි ඥානයන් ය. මෙම අභිඤ්ඤා අතර බුදුදහම වඩාත් අගය කොට සලකන අභිඤ්ඤා තුනක් ඇත. එනම්, පුබ්බේනිවාසානුස්සති ඥානය, චුතූපපාත ඥානය හා ආසවක්ඛය ඥානයයි. ත්‍රිවිද්‍යා වශයෙන් ද එය හඳුන්වයි. මින් පළමු ඥාන දෙකෙන් කර්මානුරූපීව සත්වයාගේ බව ගමන සිදුවෙන ආකාරය පිළිබඳ වැටහීමක් ලැබෙන අතර ආසවක්ඛය ඥානය තුළින් එම සංසාර ගමන නතර කිරීමට අවශ්‍ය දැනුම ලබා දේ.

මෙම අභිඤ්ඤා පිළිබඳ තවදුරටත් සඳහන් කරන්නේ නම් පෙර සඳහන් කළ පරිදි පංච අභිඤ්ඤාවන් බුදුදහම පහළ වන විට ද භාරතීය සමාජය තුළ පැවතියේ ය. එහෙත් මෙම ඥානයන් පිළිබඳ නිවැරිදි වැටහීමක් ලබා ගැනීමට නොහැකිව ඇත්තේ ඒ පිළිබඳ විශේෂ විග්‍රහයක් හමු නොවන බැවිනි. සත්ත්වයින්ගේ චුති උත්පත්ති දෙක ඇසින් සාක්‍ෂාත් කළ යුතු යැයි දක්වා තිබේ. ''චක්ඛුනාති දිබ්බෙන චක්ඛුනා'' යනුවෙන් දැක්වෙන බැවින් මෙහි ඇස යනුවෙන් දක්වා තිබෙන්නේ මාංශමය ඇස නොවන බවට ඉඟියක් ලැබේ. කෙසේ වුව ද මනෝමය ශරීරය පිළිබඳ දක්වන තැන එය සියලු අංග ලක්‍ෂණයන්ගෙන් හීන නොවූ බව දක්වා තිබීම නැවතත් සිහිපත් කළ යුතුය. කෙසේ වුව ද අභිඤ්ඤා පිළිබඳ බුදුදහමේ දැක්වෙන විග්‍රහය තුළින් මෙම අභිඤ්ඤා හුදෙක් පුද්ගල අනුභූතියෙන් තොර වූවක් නොව පුද්ගලයාගේ ඉන්ද්‍රියානුසාරී අත්දැකීම් සීමාව තුළ සිට තව දුරටත් ඉන්ද්‍රිය අත්දැකීම් පුළුල් කිරීම තුළින් ලැබෙන්නක් බව පැහැදිලි වේ. විශේෂයෙන්ම බුදුදහමට ආවේණික වූ ආසවක්ඛය ඥානය



පිළිබඳ පැහැදිලි කිරීමේ දී එය සැබැවින්ම පුද්ගල අනුභූතියට ඍජුව ලක්කළ හැක්කකි.

## පරිඤ්ඤා හා පඤ්ඤා බුදුදහමේ දක්වා ඇති ආකාරය

ම.නි. මූලපරියාය සූත්‍රයට අනුව බුදුරජාණන් වහන්සේ මෙන්ම රහතන් වහන්සේලා සංසාරය හා සම්බන්ධ සියලු තත්ත්වයන් පිළිබඳ හරියාකාර අවබෝධයක් ලබාගෙන තිබේ. එය හඳුන්වා තිබෙන්නේ පරිඤ්ඤා යනුවෙනි.[20] පාලි නිකාය ග්‍රන්ථවල නිරන්තරයෙන් මෙම යෙදුම දැකගත හැකිය. එය දක්වන අවස්ථාවන්වලදී මෙය පුද්ගල ඥානයට සම්බන්ධව දක්වා ඇති අතර ඉන් පැහැදිලි කර තිබෙන්නේ සංඛත ලෝකයේ සබෑ ස්වරූපය පිළිබඳ පරිපූර්ණ අවබෝධයක් ලබාගැනීම වශයෙන්ය.

ම.නි. මහා දුක්ඛක්ඛන්ධ සූත්‍රයට අනුව කිසියම් පුද්ගලයෙන් තම රූප, වේදනා වශයෙන් දක්වන තත්ත්වයන් පිළිබඳ සබෑ ස්වරූපය වටහා ගන්නේ ඒවා ආස්වාදය කිරීමෙන් එහි භයානක බව තේරුම් ගැනීමත්, ආදීනව තේරුම් ගැනීමත් ඉන් අනතුරුව ඉන් මිදීම තුළින් සැබෑ නිදහස ලබා ගැනීමත් තුළිනි. එය ලෝකයේ යථා ස්වරූපය පිළිබඳ පරිපූර්ණ වැටහිමකි. පරිඤ්ඤා යනුවෙන් දක්වා තිබෙන්නේ එයයි.[21]

පඤ්ඤා යන්න බුදුදහමේ පැහැදිලි කරන්නේ සීලය හා සමාධිය පදනම් කරගෙන ලබාගන්නා පරිපූර්ණ මානසික තත්වයකි. මහාවේදල්ල සූත්‍රයට අනුව පඤ්ඤා යනු වැඩිය යුත්තකි (පඤ්ඤා භාවෙතබ්බා).[22] ප්‍රඥාව ලබා ගැනීමේදී චතුරාර්‍ය්‍ය සත්‍ය පිළිබඳ අවබෝධය අනිවාර්ය වේ. විමුක්තිය අරමුණුකරගෙන ක්‍රමානුකූලව ආශ්‍රව ක්‍ෂය කිරීම ද පඤ්ඤා වශයෙන් දක්වා තිබේ. කෙසේ වුව ද පඤ්ඤා යන්න බුදුදහමේදී කිසිදු අත්භූත ඥානයක් වශයෙන් දක්වා නොමැති අතර ලෝකය පිළිබඳව යථා තත්වය තේරුම් ගැනීම තුළින් ලබාගන්නා අවබෝධයක් වශයෙන් පැහැදිලි කර ඇත.

මේ අනුව බුදුදහමේ සඳහන් කරන ඥානය යනු කුමක්දැයි මනාව පැහැදිලි වේ. පෙර අපර දෙදිගම චින්තකයින් තර්කය, ශ්‍රැතිය, අනුභූතිය වැනි මාර්ග ඔස්සේ ඥානය පිළිබඳව විවිධ ඉගැන්වීම් දක්වා ඇතත්, බුදුදහමට අනුව ඒවා ප්‍රතික්ෂේප වන්නේ ඒවා සම්පූර්ණයෙන්ම වැරදි නිසා නොව පරිපූර්ණ ඥානයක් ඒ තුළින් ලැබිය නොහැකි බැවිනි. පුද්ගලයාගේ ආත්මීය සාධක හේතුවෙන් ඒවාට සීමා පැනවේ. අනුභූතිවාදී ස්වරූපයක් බෞද්ධ ඥානවිභාගාත්මක ඉගැන්වීම් තුළින් ප්‍රකට වුව ද එය හුදු ඉන්ද්‍රියානුභූතියටම සීමාවූවවක් නොවන අතර බෞද්ධ ඉගැන්වීම් තුළින්ම එය අවබෝධ කරගත යුත්තකි. බෞද්ධ ඥාන මාර්ගය උපයෝගීතාවාදීය. එහිදී නිශ්චිත පදනමක් මත පිහිටා නිශ්චිත ඉලක්කයක් කරා පුද්ගලයා මෙහෙයවයි. බාහිර ලබපෑමකින් තොරව ස්වකීය ඥානයෙන්ම ප්‍රත්‍යක්ෂ කොට දතහැකි ප්‍රායෝගික බවක් පැනවීම බෞද්ධ ඥාන මාර්ගයේ ඇති සුවිශේෂත්වය යි.

## ආන්තික සටහන්

1. ම. නි. II, සන්දක සූත්‍රය, බු. ජ. ත්‍රි. 822 පිටුව.
2. ''එථ තුම්හෙ මා අනුස්වෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය, මා පිටකසම්පදාය. මා තක්කහෙතු, මා නය හෙතු, මා ආකාරපරිවිතක්කෙන, මා දිට්ඨී නිජ්ඣානක්ඛත්තියා, මා භබ්බරූපතාය, මා සමනො නො ගරූ'ත.'' අං. නි. කාලාම සූත්‍රය, බු. ජ. ත්‍රි. 188 පිටුව.
3. ''යදා තුම්හෙ අත්තනාව ජානෙය්‍යාථ ඉමෙ ධම්මා අකුසලා ඉමේ ධම්මා සාවජ්ජා අහිතාය දුක්ඛාය සංවත්තති අථ තුම්හෙ කාලාමා පජහෙය්‍යාථ'' අං. නි. කාලාම සූත්‍රය, බු. ජ. ත්‍රි., 189 පිටුව.
4. ''එතු විඤ්ඤූ පුරිසො අසඨො අමායාවි උජුජාතිකො අහමනුසාසාමි. අහං ධම්මං දෙසෙමි. යථානුසිට්ඨං තථා පටිපජ්ජමානො න චිරස්සෙව සාමඤ්ඤෙව ඤාස්සත. සාමං දක්ඛිති'' ම. නි. II, වෙඛනස්ස සූත්‍රය, බු. ජ. ත්‍රි., 400 පිටුව.
5. ම. නි. I, මධුපිණ්ඩික සූත්‍රය, බු. ජ. ත්‍රි. 280 පිටුව.
6. අං. නි. VI, ගිරිමානන්ද සූත්‍රය, බු. ජ. ත්‍රි. 194 පිටුව.
7. සු.නි. අට්ඨකවග්ගය, මාගන්ධිය සූත්‍රය, බු. ජ. ත්‍රි., 258 පිටුව.
8. -එම.



9. සු. නි. අට්ඨකවග්ගය, චූලවියූහ සූත්‍රය, බු. ජ. ත්‍රි., 268 පිටුව.
10. ඛු. නි. ගුහට්ඨක සූත්‍රය, බු. ජ. ත්‍රි., 80 පිටුව.
11. අං. නි. ඪ, සම්බෝධි සූත්‍රය, බු.ජ.ත්‍රි., 370 පිටුව.
12. සං.නි., III, ඵෙණපිණ්ඩූපම සූත්‍රය, බු.ජ.ත්‍රි., 244 පිටුව.
13. දී.නි. I, පොට්ඨපාද සූත්‍රය, බු.ජ.ත්‍රි., 406 පිටු.
14. දී.නි. I, සාමඤ්ඤඵල සූත්‍රය, බු.ජ.ත්‍රි. 134 පිටුව.
15. -එම- 136 පිටුව.
16. -එම- 142 පිටුව.
17. -එම- 138 පිටුව.
18. -එම- 142 පිටුව.
19. -එම- 146 පිටුව.
20. ම.නි. I, මූලපරියාය සූත්‍රය, බු. ජ. ත්‍රි., 10-13 පිටු.
21. ම.නි. I, මහාදුක්ඛක්ඛන්ධ සූත්‍රය, බු. ජ. ත්‍රි., 214 පිටුව.
22. ම.නි. I, මහාවේදල්ල සූත්‍රය, බු. ජ. ත්‍රි., 686 පිටුව.